## ජාතික අධ්‍යාපන ආයතනය - 2013

ජාතික අධ්‍යාපන ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 19 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | 2009 ජුනි 01 දිනැති අංක 30 (I) හා 30(II) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ | 1,365,904 | ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණි හැර අනෙකුත් නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය කිරීමේදි නියැදි පරික්ෂාවට භාජනය කල නිළධාරීන් 31 දෙනෙකු අතුරින් 29 දෙනෙකු සඳහා 2009 ජනවාරි 01 සිට 2014 අප්‍රේල් 30 දක්වා රු.1,209,220 ක වැටුපක් වැඩිපුර ගෙවා තිබූ අතර ඒ මත රු.156,684 ක සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රේෂණය කර තිබුණි. |
| (ආ) | 2006 ජුලි 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා 2007 පෙබරවාරි 23 දිනැති NSCC/PO/01/33 දරන ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාවේ ලිපිය | 114,980 | මාණ්ඩලික නිළධාරීන් 148 දෙනෙකු අතුරින් විගණන නියැදි පරික්ෂණයට භාජනය කල විශ්‍රාමික මාණ්ඩලික නිලධාරියෙකු සඳහා රු.96,480 ක වැටුප්ද රු.18,500 ක විශ්‍රාම පාරිතෝෂිත මුදල්ද වැඩිපුර ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් සිදු වී ඇති මූල්‍ය ප්‍රතිඵලය රු.36,496,150 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.14,654,153 ක් විය. 2012 වර්ෂයේදී රජයේ ප්‍රදාන සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය ප්‍රකාරව, විලම්භිත ආදායම රු.49,281,011 ක් හඳුනා නොගැනීමෙන් වූ වරද 2013 වර්ෂයේදී නිවැරදි කර තිබූ අතර 2013 වර්ෂයේ අවසන් ගිණුමේ දක්වා තිබෙන 2012 වර්ෂයේ සංසන්දනාත්මක අගයන්, නැවත

ගණනය (Restated) අනුව ඉදිරිපත් කර ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,841,997 ක වාසිදායක තත්ත්වයක් පෙන්නුම් කරන අතර මෙම විචලනයට මෙහෙයුම් ආදායම් රු.50,636,600 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පුද්ගලයින් 03 දෙනෙකු විසින් විනය විරෝධි හැසිරීම් මත සේවයෙන් පහ කිරීම සහ ගුරු පුහුණු සහතික ලබා ගැනීම සම්බන්ධයෙන් ආයතනයට එරෙහිව අධිකරණ වල නඩු 03 ක් ගොනුකර තිබුණි.

### 3.3 වියදම් වල අසාමාන්‍ය වැඩි වීම

2013 වර්ෂයේ වියදම් 2012 වර්ෂයේ වියදම් සමඟ සැසඳීමේදී පහත පරිදි විචලනයන් නිරීක්ෂණය විය.

| වැය විස්තරය | 2013 | 2012 | විචලනය | විචලනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| විවිධ වියදම් | 3,964,184 | 969,726 | 2,994,458 | 309 |
| දුරකථන ගාස්තු | 3,156,145 | 1,645,426 | 1,510,719 | 92 |
| වැඩමුළු - ඉන්ධන වියදම් | 131,374 | 69,871 | 61,503 | 88 |
| පවිත්‍රතා සේවා | 8,065,524 | 5,483,419 | 2,582,105 | 47 |
| තැපැල් ගාස්තු | 1,072,470 | 728,164 | 344,306 | 47 |
| ප්‍රචාරණය | 1,596,123 | 1,184,714 | 411,409 | 35 |
| ජල සැපයුම් ගාස්තු | 1,000,735 | 774,089 | 226,646 | 29 |

මෙම විචලනයන් සඳහා හේතු වී ඇත්තේ භාණ්ඩවල මිල වැඩි වීම, සෙස් බදු, විදුලි ගාස්තු වැඩිවීම්, ඉන්ධන ගාස්තු වැඩිවීම හා ප්‍රදානය කරන ටෙන්ඩර් සඳහා මිල ගණන් වැඩි වීම බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ආයතනයේ සේවයේ යෙදී සිටි නිලධාරීන් 06 දෙනෙකු අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී යළි සේවයට වාර්තා නොකිරීමෙන් ගිවිසුම් කඩ කිරීම මත එකතුව රු.11,699,587 ක් ආයතනයට අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට අවුරුදු 04 සිට අවුරුදු 12 දක්වා කාලපරාසයක් ගත වී තිබුණි.

### 4.3 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භෝජනාගාරය සඳහා පාරිභෝජ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සැපයුම්කරුවන් විධිමත් පරිදි ලියාපදිංචි කර නොගැනීම නිසා

තරගකාරී මිලට භාණ්ඩ මිලදී ගැනීමට තිබූ අවස්ථාව අහිමි වීම හේතුවෙන් ආසන්න වශයෙන් රු.1,366,126 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. එසේම ආහාර පිළියෙල කිරීමේදී නිශ්චිත කෑම වට්ටෝරුවක් පිළියෙල කර නොතිබීම හා එක් පුද්ගලයෙකුගේ පරිභෝජන ප්‍රමාණය පිළිබඳව සැලකිලිමත් වීමකින් තොරව ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම හේතුවෙන් පාරිභෝජ්‍ය භාණ්ඩ අධි මිලදී ගැනීම් වෙනුවෙන් රු.1,067,595 ක පාඩුවක්ද ආයතනයට සිදුවී තිබුණි. අදාල නිළධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන ඇති බවත් වර්තමානයේදී පද්ධතියේ පැවති දුර්වලතාවයන් නිවැරදි කර ඇති බවත් ඒ තුළින් ආදායම සියයට 13 කින් වර්ධනය කර ගැනීමටත් වියදම සියයට 23 කින් අඩුකර ගැනීමටත් හැකි වී ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා ඇත.

(ආ) භෝජනාගාරය සඳහා පාරිභෝජ්‍ය භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් සැපයුම්කරුවන් වෙත ගෙවීම් කිරීමේදී අයිතිකරුට හෝ ඔහුගේ ව්‍යාපාර නාමයට පරිබාහිර වූ පුද්ගලයෙකුට අවස්ථා 112 කදී රු.4,245,925 ක් වටිනා චෙක්පත් නිකුත් කර තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව, තත්‍ය සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේදී පහත පරිදි සේවක පුරප්පාඩු සහ අතිරික්තයන් නිරීක්ෂණය විය.

| | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 108 | 61 | 47 | - |
| තෘතියික මට්ටම | 200 | 92 | 108 | - |
| ද්විතියික මට්ටම | 223 | 178 | 45 | - |
| ප්‍රාථමික මට්ටම | 121 | 106 | 15 | - |
| වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම මත) | - | 29 | - | 29 |
| එකතුව | 652 | 466 | 215 | 29 |

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වන කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දිනද අවසාන මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 29 දිනද විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

2013 වර්ෂයේ තත්‍ය වියදම්, අයවැය ගත වටිනාකම් සමඟ සැසඳීමේදී සියයට 24 සිට සියයට 356 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) භෝජනාගාර මිලදී ගැනීම්
(ආ) භෝජනාගාරයේ අභ්‍යන්තර පාලනය
(ඇ) ගිණුම් කටයුතුභාවය
(ඈ) මුදල් හා බැංකු
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය
(ඊ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(උ) තොග පාලනය